Australian Government

COVID-19 VACCINATION

# ඔබගේ කෝවිඩ්-19 AstraZeneca එන්නතට පසුව

අවසන් වරට යාවත්කාලීන කලේ 2021 ජූලි 30 දින

## එන්නත සම්බන්ධයෙන්

අද ඔබට **කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා (AstraZeneca)** එන්නත ලබාදුණි.

මෙම එන්නත මගින් මිනිසුන් හට කෝවිඩ්-19 ආසාදනයවීම වළක්වා ගත හැකිය. කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නතෙහි හි කිසිදු SARS-CoV-2 ජීවී වයිරසයක් (කෝවිඩ්-19 ඇති කරන වයිරසය) අඩංගු නොවන අතර ඔබට කෝවිඩ්-19 ආසාදනය ඇතිකල නොහැක. එහි අඩංගු වන්නේ SARS-CoV-2 වයිරසයේ වැදගත් කොටසක් වන ස්පයික් ප්රෝටීන් (spike protein) ලෙස හඳුන්වන ජාන කේතයවේ. මෙය ඔබගේ සෛල තුලට ගෙන යන්නේ හානිදායක නොවන සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාව ඇතිකරන වාහක වයිරසයක් (ඇඩෙනොවයිරසයක්) මගිනි. එන්නත ලබා ගැනීමෙන් පසුව, ඔබගේ ශරීරය මගින් ස්පයික් ප්රෝටීනය සකස් කරන අතර එය SARS-CoV-2 වයිරසය හඳුනාගෙන එයට එරෙහිව සටන් කිරීමට ඉගෙන ගනී. මෙයින් අදහස් වන්නේ මෙය අනෙක් සෛලවලට පැතිරී ආසාදනය ඇතිකල නොහැකි බවයි.

## එන්නත ලබා දීමෙන් පසු බලාපොරොත්තු විය හැකි දේ

ඕනෑම එන්නතක් මෙන්, කෝවිඩ්-19 එන්නත ලබාගත් පසු සමහර අතුරු ආබාධ ඇතිවිය හැකිය.

**කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත** ලබා ගැනීමෙන් පසු **බහුලව** ඇතිවිය හැකි අතුරු ආබාධ අතර පහත දේ ඇත:

- එන්නත ලබාදුන් ප්‍රදේශයේ වේදනාව, ඉදිමීම, මොළොක් බව, රත්පැහැ හෝ කසන බව
- වෙහෙසකරබව
- හිසරදය
- මාංශ පේශි රුදාව
- ඔක්කාරය
- උණ සහ ශීතල බව
- අසනීප ගතිය දැනීම
- හන්දිපත් රුදාව.

**කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත** ලබා ගැනීමෙන් පසු **අඩු වශයෙන්** ඇතිවිය හැකි අතුරු ආබාධ අතර පහත දේ ඇත:

- ඉදිමුණු වසා ගැටිති
- අත් පා වේදනාව
- හිස කැරකෙන බව
- කෑම අරුචිය

- බඩේ කැක්කුම.

මෙම අතුරු ආබාධ සාමාන්‍යයෙන් ඉතා අඩු වශයෙන් දැනේ. එන්නත ලබා ගත් අයගෙන් තුනෙන් දෙකකට පමණ ඇතිවන අතර, එන්නත ලබා දී දිනක් ඇතුලත ඇතිවන අතර දින එකක් හෝ දෙකක් ඇතුලත නැතිව යයි.

වෙනත් එන්නත් සමඟ සැසඳීමේදී මෙම එන්නත සමහර අය අතර ෆ්ලූ ආකාරයේ වඩා සැලකිය යුතු ආකාරයේ රෝග ලක්ෂණ ඇතිවිය හැකි අතර සාමාන්‍ය රාජකාරිවලින් බැහැරව සිටීමට අවශ්‍ය විය හැකිය. මෙම රෝග ලක්ෂණ දෙවන මත්‍රාව සමඟ සැසඳීමේදී, වඩා බහුලව ඇතිවන්නේ පළමුවන මාත්‍රාව ගැනීමට පසුවය.

එන්නත ලබා ගැනීමෙන් පසු 1-2 දිනවල එන්නත ලබාදුන් ස්ථානයේ වේදනාව හෝ උණ, හිසරදය හෝ ඇඟපත වේදනා ඇතිනම්, පැරසිටමොල් ලබාගත හැකිය. මෙය ලබා ගැනීම මගින් ඉහත රෝග ලක්ෂණවලින් සමහරක් අඩුකර ගැනීමට උපකාර විය හැකිය. එන්නත ලබා ගැනීමට පෙර පැරසිටමොල් හෝ අයිබියුප්‍රොෆීන් ලබා ගැනීම අවශ්‍ය නැත. එන්නත ලබාදුන් ප්‍රදේශයේ ඉදිමුවක් ඇතිනම්, ශීතල ඇතිව තද කරන දෙයක් (cold compress) භාවිතා කල හැකිය.

**කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත** ලබා ගැනීමෙන් පසුව **දුර්ලභ ලෙස ඇතිවිය හැකි** බවට වාර්තාවී ඇති අතුරු ආබාධ පහත ඒවාවේ:

- දරුණු අසාත්මිකතා ප්‍රතිචාර (ඇනෆිලැක්සිස්):
  - කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නත ලබා ගැනීමෙන් පසු ඇනෆිලැක්සිස් ඇතිවීම ඉතා විරළය. ඕස්ටේලියාවේ අනුපාතය වෙනත් ඕනෑම එන්නතක් සම්බන්ධ අනුපාතය හා සමානවේ.

- රුධිරය කැටි ගැසීම (ත්‍රොම්බෝසිස්) සහ අඩු රුධිර පට්ටිකා (ත්‍රොම්බොසයිටොපීනියා) ඇතිවන ත්‍රොම්බොසයිටොපීනියා සමඟ ත්‍රොම්බෝසිස් සින්ඩ්‍රෝමය (TTS) ලෙස හඳුන්වන තත්වයක් ඇතිවිය හැක.
  - TTS යනු ඉතා විරළ තත්වයක් බව සහ විදේශවලින් ලැබෙන තොරතුරු වලින් පෙන්නුම් කරයි
  - රුධිර කැටි සිරුරේ විවිධ අංගවල දැකිය හැකිය, මෙම ස්ථාන අතර, මොළය (මෙයට සෙරිබෙරල් වේනස් සයිනස් ත්‍රොම්බෝසිස් ලෙස හැඳින්වේ) සහ යටිබඩ (මෙයට ඉඩියොපතික් ස්පැලැන්චිනික් වේන් ත්‍රොම්බෝසිස් ලෙස හැඳින්වේ) ඇත. අඩු රුධිර පට්ටිකා සංඛ්‍යාව හේතුවෙන් රුධිර වහනය සිදුවිය හැකිය.
  - මෙම රෝග ලක්ෂණ ඇති වන්නේ බොහෝවිට එනනත ලබා ගෙන දින 4 සිට 42 අතර කාලයේදීය.
  - මෙම රෝගී තත්වය ඇති අය ඉතාම අසනීප වන අතර රෝහල්ට යාම අවශ්‍යවේ. මෙම මගින් දීර්ඝ කාලීන ආබාධිත බව හෝ මරණය වුවද ඇතිවිය හැකිය.
  - TTS සම්බන්ධ වැඩිදුර විස්තර [කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නස සහ TTS සම්බන්ධ රෝගීන් සඳහා තොරතුරු පත්‍රිකාව] වෙත ප්‍රවේශවීමෙන් ලාබ ගත හැකිය.

**පහත අවස්ථාවල එන්නත ලබා ගැනීමෙන් පසු වෛද්‍ය අවධානය ලබා ගත යුතුවේ:**

- ඔබට අසාත්මික ප්‍රතිචාරයක් ඇති බවට ඔබ සිතන අවස්ථාවල. ඔබට හුස්ම ගැනීමේ අපහසුව, ඇදුම ආකාරයේ වීසින්, හද ගැස්ම වැඩිවීම හෝ කලාන්තවීම ආදී රෝග ලක්ෂණ ඇතිනම්, දුරකථන අංක 000 අමතන්න.
- අපේක්ෂිත අතුරු ආබාධයක් ඇතිවූ අතර එය දින කිහිපයකට පසුවද පහව ගියේ නැතිනම්.
- එන්නත ලබා ගැනීමෙන් දින 4 සිට 42 අතර කාලයේදී පහත රෝග ලක්ෂණවලින් කිසියම් එකක් ඇතිනම්:
  - එන්නත ලබා දීමෙන් පැය 48 කට පසුව හෝ පැය 48 කට පසුව ඇතිවන දිගින් දිගට පවතින හිසරදය. මුලදී සරල වේදනා නාශක මගින් මෙම හිසරදය නැතිවිය හැකි වුවද, මෙය දිගටම පවතී
  - පෙනීමේ අපහැදිලිබව
  - මුහුණේ හෝ අත් පා වල දුර්වලබව
  - ව්‍යාකූල බව හෝ අසිහිය.
  - හුස්ම කෙටිවීම
  - පපුවේ වේදනාව
  - දිගටම පවතින යටිබඩ වේදනාව
  - කකුල් ඉදිමීම
  - එන්නත ලබා නොදුන් ස්ථානවල පැහැදිලි කල නොහැකි ආකාරයේ දදයක් හෝ සීරීමක්.

ඔබ මැතකදී එන්නත ලබා ගත් බවට වෛද්‍යවරයාට දන්වන බවට වග බලා ගන්න. හදිසි නොවන රෝග ලක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ සාමාන්‍ය සෞඛ්‍යය රැකවරණ සපයන්නා (පවුලේ වෛද්‍යවරයා) වෙත යා හැකිය.

## එන්නත්වල ආරක්ෂාකාරී බව නියාමනය කිරීම සහ අතුරු ආබාධ වාර්තා කිරීම

සැක සහිත අතුරු ආබාධ සම්බන්ධයෙන් ඔබගේ එන්නත් සපයන්නා හෝ වෙනත් සෞඛ්‍යය රැකවරණ වෘත්තීකයන් හට වාර්තා කල හැකිය. ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙත හෝ කෙළින්ම ප්‍රතිකාරක භාණ්ඩ පරිපාලනය (Therapeutic Goods Administration (TGA)) වෙත හෝ විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

ඒ සම්බන්ධයෙන් ඔබ විසින්ම වාර්තාවක් ඉදිරිපත් කිරීම යෝග්‍යවේ. TGA වෙබ් අඩවියේ https://www.tga.gov.au/reporting-suspected-side-effects-associated-covid-19-vaccine වෙත පිවිස එහි ඇති උපදෙස් අනුගමනය කරන්න.

## එන්නතට පසු කෝවිඩ්-19 සම්බන්ධ පරීක්ෂා සිදු කිරීම

කෝවිඩ්-19 එන්නතෙහි සමහරක් අතුරු ආබාධ කෝවිඩ්-19 ආසාදනයේ රෝග ලක්ෂණ හා සමාන විය හැකිය (උදා. උණ). කෙසේවුවද, කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නතෙහි කිසිදු ජීවී SARS-CoV-2 වයිරසයක් අඩංගු නොවන අතර ඔබට කෝවිඩ්-19 ආසාදනය ඇතිකල නොහැක. ඔබ විසින් පහත අවස්ථාවල කෝවිඩ්-19 පරීක්ෂණයක් කරවා ගැනීම හෝ හුදෙකලාවීම අවශ්‍ය නොවේ:

- එන්නත ලබා ගෙන පළමු දින දෙකෙහිදී උණ, හිසරදය හෝ වෙහෙසකර බව වැනි සාමාන්‍ය රෝග ලක්ෂණ ඇතිවීම, සහ
- කිසිදු ශ්වසන රෝග ලක්ෂණ (උදා: සොටු ගැලීම, කැස්ස, උගුරේ ආසාදන, ගඳ සුවඳ හෝ රස නොදැනීම) නොමැති බවට ඔබට විශ්වාස නම්.

කෙසේ වුවද, ඔබගේ ප්‍රාන්තයේ/ටෙරිටරියේ ඇති වඩාත්ම යාවත්කාලීන මාර්ගෝපදේශ පරීක්ෂා කල යුතුය. ඔබගේ ප්‍රදේශයේ කෝවිඩ්-19 පැතිරීමක් ඇතිනම්, මෙම උපදෙස් වෙනස් විය හැකිය. කෙසේ වුවද, ඔබ වෙනත් නිර්නායකයන් සපුරාලන්නේ නම්, උදා. ඔබ කෝවිඩ්-19 ආසාදිතයෙකු හා සමීපව සම්බන්ධවුණු අයෙකු නම්, ඔබ විසින් කෝවිඩ්-19 පරීක්ෂණයක් කර ගත යුතුය. සැකයක් ඇතිනම්, වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

## ඔබගේ දෙවෙනි හමුවීම අමතක නොකරන්න

අවම වශයෙන් සති 12 ක් ඇතුලත කෝවිඩ්-19 ඇස්ට්‍රාසෙනකා එන්නතින් මාත්‍රා දෙකක් ලබා ගැනීම වැදගත්වේ. සමහර තත්ව යටතේ අතරතුර කාලය සති 12 සිට 4 කට නොඅඩු කාලයක් දක්වා අඩු කිරීම යෝග්‍යවේ. දෙවන මාත්‍රාව මගින් කෝවිඩ්-19 ට එරෙහිව වැඩිපුර ආරක්ෂාව ලබාදේ.

## හමුවීමේදී ඔබ ලබා දෙන තොරතුරු උපයෝගී කර ගන්නා ආකාරය

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන, තැන්පත් කර තබන සහ භාවිතා කරන ආකාරය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා https://www.health.gov.au/using-our-websites/privacy/privacy-notice-for-covid-19-vaccinations වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.